# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

# ඇබෑර්තු

## අක්ෂි තාක්ෂණ ශිල්පී තනතුර

ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්** - ශ්‍රී ලංකා අක්ෂි තාක්ෂණවේද පාසලෙන් ලබාගත් සහතිකය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අක්ෂි තාක්ෂණ ශිල්පියකු ලෙස ලියාපදිංචිය සමග වසර තුනක (03) පළපුරුද්ද.

**වයස** - අයදුම්කරුවන් වයස අවුරුදු 50 ට අඩු අය විය යුතුය. වයස අවුරුදු 50 ට අඩු අයදුම්කරුවන් නොමැති නම් අවුරුදු 50 ට වැඩි අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සළකා බැලේ.

**වැටුප් පරිමාණය** - රු. 43,310-10X600-49,310/- මාසිකව වැටුප් පියවර - රු. 43,310/- මාසිකව

**සේවා නියුක්තියේ කොන්දේසි** - ස්ථිර (අවුරුදු 50 ට අඩු) සහ සේවක අර්ථසාධක අරමුදල් පදනම, රාජ්‍ය ආයතනයක යම් අයදුම්කරුවකු මෙම තනතුර සඳහා ද්විතියක පදනම මත අයදුම්කිරීමට බලාපොරොත්තු වේ නම් ඔවුන්ගේ අයදුම්පත් සළකා බලනු ලැබේ.

රජයේ සේවයේ තනතුරු දරන අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවයේ නියුතු දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන් මගින් එවා පිටපතක් ඍජුව යොමු කළ යුතුය. තනතුර සඳහා තෝරගනු ලැබුවහොත් අයදුම්කරු නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයක් අයදුම්පතට අමුණා එවිය යුතුය. තනතුරට පත්කිරීමේ හෝ පත් නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝග්‍යශාලාව සතුවේ.

අයදුම් කරන තනතුර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන් තම සම්පූර්ණ ජීවදත්ත සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සහිත අයදුම්පත් 2024 ජනවාරි 01 වන දින හෝ ඊට පෙර පහත අත්සන් කරන අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

**සභාපති**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
**2023 දෙසැම්බර් 17**